00034

**ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය**

**අධ්‍යාපන පීඨය**

**අධ්‍යාපනවේදී (නාට්‍ය හා රංගකලා ) උපාධි වැඩසටහන - හයවන මට්ටම**

**අවසාන පරීක්ෂණය - 2016**

**අධ්‍යාපන කළමනාකරණය – ESU4115**

**කාලය : පැය (03) තුනයි.**

---

**දිනය - 2016 අප්‍රේල් 06 වේලාව - ප.ව.01.30 - ප.ව.04.30 දක්වා**

---

**1 වන කොටසේ සියලුම ප්‍රශ්නවලට ද, 2 වන කොටසේ ඕනෑම ප්‍රශ්න තුනකට (03) ද පිළිතුරු සපයන්න.**

## <u>1 වන කොටස</u>

01. "කළ යුතු දේ මනා ලෙස කිරීම කළමනාකරණය වේ. " මෙම ප්‍රකාශය පැහැදිලි කරන්න.

02. අධ්‍යාපන කළමනාකරණයේ අවශ්‍යතාව කරුණු දෙකක් (02) ක් ඇසුරින් කෙටියෙන් පැහැදිලි කරන්න.

03. "පොකුරු පාසල් ක්‍රමය" යනවෙන් අදහස් කරනු ලැබුවේ කුමක් ද?

04. 2 වර්ගයේ පාසලක සංවිධාන ව්‍යුහය ඇඳ දක්වන්න.

05. විදුහල්පතිගේ නාමික නායකත්ව භූමිකාව සැකෙවින් පැහැදිලි කරන්න.

06. ඵලදායී පාසලක ලක්ෂණ පහක් (05) සඳහන් කරන්න.

07. "බලය " හා "අධිකාරිත්වය" වෙන්කර දක්වන්න.

08. පාසලේ ශ්‍රේණි සමායෝජකගේ කාර්යයන් පහක් (05) ලැයිස්තු ගත කරන්න.

(ලකුණු 5 x 8 = 40)

## 2 වන කොටස

09. (i) පාසල් පාදක කළමනාකරණය යන්න, කෙටියෙන් පැහැදලි කරන්න. (ලකුණු 04)

(ii) අධ්‍යාපන කළමනාකරණ ක්‍රියාවලිය තුළ පාසල් පාදක කළමනාකරණයේ වැදගත්කම කරුණු තුනක් (03) ක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 07)

(iii) පාසල් පාදක කළමනාකරණ ක්‍රියාවලියේදී, පාසල මුහුණ දෙන ගැටලු තුනක් (03) සඳහන් කර ඒවා මඟහරවා ගැනීමට යෝජනා ඉදිරිපත් කරන්න. (ලකුණු 09)

10. (i) මාස්ලෝගේ අවශ්‍යතා ධූරාවලිය රූප සටහනකින් දක්වන්න. (ලකුණු 04)

(ii) පාසලේ කළමනාකරණ ක්‍රියාවලිය සඳහා මාස්ලෝ විසින් ඉදිරිපත් කළ අවශ්‍යතා ධූරාවලිය දායක කර ගත හැකි අංශ තුනක් උදාහරණ දක්වමින් සාකච්ඡා කරන්න.

(ලකුණු 08)

(iii) ඉහත (ii) හි පිළිතුරට ඔබ විසින් සඳහන් කළ අංශ පිළිබඳ අවධානය යොමු කිරීමේ වැදගත්කම, හා එමගින් පාසල් කළමනාකරණය සුසාධ්‍යවන ආකාරය පරීක්ෂා කරන්න. (ලකුණු 08)

11. (i) සායනික අධීක්ෂණ ක්‍රියාවලියේදී අධීක්ෂකයගේ සහ අධීක්ෂිතයගේ භූමිකාව පහත අවස්ථා යටතේ පැහැදිලි කරන්න.

(අ) පූර්ව අධීක්ෂණ අවස්ථාව

(ආ) අධීක්ෂණ අවස්ථාව

(ඇ) පශ්චාත් අධීක්ෂණ අවස්ථාව (ලකුණු 12)

(ii) සායනික අධීක්ෂණ ක්‍රියාවලියේ දී ද්විපාර්ශ්වීය වශයෙන් ඇති විය හැකි ගැටලු දෙක (02) බැගින් සඳහන් කර ඒ සඳහා ගත හැකි විසඳුම් යෝජනා කරන්න.

(ලකුණු 08)

00034

12. (i) අධ්‍යාපන කළමනාකරණය "විමධ්‍යගත" කිරීම යන්න පැහැදිලි කරන්න.

(ලකුණු 04)

(ii) 1987 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වෙනි සංශෝධනයට අනුව අධ්‍යාපන පරිපාලනය හා කළමනාකරණ බලතල විමධ්‍යගත වූ ආකාරය උදාහරණ හතරක් (04) වත් දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 08)

(iii) ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලනය හා කළමනාකරණ බලතල විමධ්‍යගත කිරීම නිසා ඇතිව ඇති ගැටලු දෙකක් (02) සඳහන් කර ඒවාට ප්‍රායෝගික විසඳුම් යෝජනා කරන්න. (ලකුණු 08)

13. (i) ශ්‍රී ලංකාවේ අධ්‍යාපන කළමනාකරණයේ පවත්නා ගැටලු තුනක් (03) සඳහන් කරන්න.

(ලකුණු 03)

(ii) ඉහත සඳහන් කරන ලද ගැටලුවලින් එකක් තෝරා, එය පාසලේ කළමනාකරණ ක්‍රියාවලියට බලපාන ආකාරය උදාහරණ දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 08)

(iii) ඔබ ඉහත දක්වන ලද තත්ත්ව අවම කර ගැනීමට පාසල් කළමනාකරණය හා රජය ගතයුතු ක්‍රියාමාර්ග යෝජනා කරන්න. (ලකුණු 09)

14. (i) පහත සඳහන් මාතෘකා දෙකක් (02) තෝරා කෙටි සටහන් ලියන්න.

- (i) පාසලේ පවත්නා කළමනාකරණ ගැටලු
- (ii) විදුහල්පතිගේ උපදේශන නායකත්ව භූමිකාව
- (iii) අධ්‍යාපන අමාත්‍යාංශයේ කළමනාකරණ භූමිකාව
- (iv) අරමුණු මගින් කළමනාකරණය

(ලකුණු 10 x 2 = 20)

- හිමිකම් ඇවිරිණි. -